www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ අගනුවර සමූහ අත්අඩංගුවට ගැනීම: කම්කරු පන්තියට කෙරෙන තියුනු අනතුරු ඇඟවීමක්

## Mass roundup in Sri Lankan capital: a sharp warning to the working class

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය**

**2010 ජුලි 13**

පසුගිය 3 වෙනි දා කොලඹ අවට දහස් ගනනක් පැල්පත්වාසීන්ට එල්ල කල පොලිස්-හමුදා ඒකාබද්ධ ප්‍රහාරය, මෙරට හා ජාත්‍යන්තර කම්කරු පන්තියට කෙරෙන තියුනු අනතුරු ඇඟවීමකි. මට්ටක්කුලිය ප්‍රදේශයේ සමස්ත වැඩිහිටි ජනතාව ම වැටලීමෙන් පසුව එල්ල කරන ලද මෘග ප්‍රහාරයෙන් පෙන්නුම් කර ඇත්තේ, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව විසින් ප්‍රකාශයට පත්කල "ආර්ථික යුද්ධය" තුල සාමාන්‍ය වැඩකරන ජනතාවට එරෙහිව මුදාහැර තිබෙන පොලිස්-රාජ්‍ය විධික්‍රමයන් ය.

තරුන ත්‍රිරෝද රථ රියැදුරෙකු බලහත්කාරයෙන් අත් අඩංගුවට ගෙන දරුනු ලෙස පහර දීම මගින් පොලිසිය ප්‍රදේශවාසීන්ට එරෙහිව ප්‍රකෝපකරනයක් දියත් කලේ ය. සිය ගනනක් ජනතාව කොට්ඨාශයේ පොලිසිය ඉදිරිපිට විරෝධය පෑමත් සමග ඔවුන්ට පහරදීම සඳහා ආරක්ෂක බලධාරීහු වහාම කැරලි මර්දන පොලිස් හා හමුදා භටයන් එහි පිටත් කර ඇරියහ. ප්‍රදේශවාසීන් බියගන්වමින් ද ඔවුනට කායිකව පහර දෙමින් ද නිවාස, වාහන පොඩිකරමින් ද පොලිසිය හා හමුදාව ප්‍රචන්ඩත්වය මුදාහලහ.

පසු දිනයේ 8,000 ක පමන ප්‍රදේශවාසීන් පිටටනියකට දක්කාගෙන ගිය අතර ගෝනිබිල්ලන් විසින් පෙන්වීමෙන් පසුව 200කට වැඩි පිරිසක් පොලීසිය අත්අඩංගුවට ගත්තේය. තොග පිටින් අත්අඩංගුවට ගැනීම පිලිබඳ පිලිගතහැකි කිසිදු සාක්ෂියක් ගෙන ඒමට අසමත් වීමෙන් පසුව උසාවිය 176 දෙනෙක් නිදහස් කරන ලෙස පොලිසියට නියෝග කල නමුත් 31 දෙනෙක් "වැඩිදුර පරීක්ෂනය" සඳහා රඳවගනු ලැබීය.

ප්‍රහාරය එල්ල කලේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අනුමැතිය පලවූ අයවැයක් ආන්ඩුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට යන්තම් දින පහක් ගතවූ කල්හිය. අයවැයෙන් ආන්ඩුව, අත්‍යවශ්‍ය භාන්ඩ මත බදු වැඩිකිරීම, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් කැටි කිරීම සහ විදුලිබලය, තෙල් හා වරාය ඇතුලු රාජ්‍ය ව්‍යවසායන්ට ප්‍රතිපාදන කපා හැරීම මගින් කෙලින්ම කම්කරුවන්ගේ හා දුගීන්ගේ වියදමෙන් අයවැය හිඟය අඩුකිරීමට පොරොන්දුවිය. මෙම පියවරයන්ගේ අර්ථය විශාල පරිමානයකින් රැකියා අහිමිවීම ය. තවද, මිලගනන් පිම්මේ ඉහල නගිමින් තිබිය දී වුවත් සමෘද්ධිය වැනි ආන්ඩුවේ සොච්චම් ශුභසාධන සඳහා අතිරේකව කිසිදු මුදලක් වෙන්කර නැත.

මෙම ප්‍රහාරයන්ට කම්කරුවන්ගේ ප්‍රතිරෝධය නොවැලැක්විය හැකි අතර පන්ති අරගල පුපුරා යනු ඇත. වඩාත්ම පීඩිත ස්තරයන්ගෙන් පටන් ගෙන වැඩ කරන ජනතාව බියගන්වා ත්‍රස්තකිරීම මට්ටක්කුලිය ප්‍රහාරයේ අරමුනයි. මෙය වනාහී එල්ටීටීඊයට එරෙහි පසුගිය 26 වසරක සිවිල් යුද්ධය අවධියේ දිවයිනේ උතුරේ හා නැගෙනහිරේදී වර්ධනය කල මර්දනකාරී ක්‍රමෝපායන් කොලඹට ගෙන ඒමකි. යුද්ධය පුරාම නිතිපතා දෙමල ගම්මාන වටලා ජනතාව අත් අඩංගුවට ගත් අතර එල්ටීටීඊ පරාජයෙන් වසරකට වැඩි කාලයකට පසුවත් දහස් ගනනක් තවමත් මිලිටරි පාලනය යටතේ ඇති කඳවුරු තුල කොටුකර සිටිති.

මට්ටක්කුලියේ සිදුකල ආන්ඩුවේ මෙහෙයුමෙන් පසුව රජයට අයත් ඩේලිනිව්ස් පත්‍රය ඊට පිටුබලය දෙමින් "මැරවර පාලනය"යන ශීර්ෂයෙන් යුත් දුෂ්ට කතුවැකියක් ලිවීය.

එය මෙසේ ප්‍රකාශ කලේය. "කෝපාවිෂ්ට මැරවර කල්ලි පොලිස් ස්ථානවලට කඩාවැදීම දැන් මෙරට සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ. එමනිසා තත්වය පාලනය කරගත නොහැකි හා අරාජකත්වය සමාජය තුල රජකරවීමට පෙර මෙම සංසිද්ධිය පිලිබඳව බලධාරීන්, බැරෑරුම්ව සිතා බැලිය යුතුය."

පුවත්පත පිලිගෙන ඇති අන්දමට පොලිස් කෲරකම්වලට එරෙහිව සාමාන්‍ය ජනතාව විරෝධය

පෑ අවස්ථා ගනනාවක් කොලඹ පමනක් නොව දිවයින පුරාම ඇතිවී තිබේ. උතුරේ මෙන්ම දකුනේ ද රාජපක්ෂ ආන්ඩුවේ පොලිස් මිලිටරි මර්දනය කෙරෙහි පවත්නා විරුද්ධත්වයේ හා වෛරයේ ගැඹුර මේ විරෝධතාවලින් එලිදක්වා ඇත. ආන්ඩුවේ පිටුබලය ලත් මට්ටක්කුලිය සිද්ධීන්හි එල්ලය, කිසිදු සමාජ විරෝධතාවයකට ඉඩක් නැතැයි කම්කරුවන්ට, තරුනයින්ට හා ගම්බද දූගීන්ට පනිවිඩයක් නිකුත් කිරීම ය.

ආන්ඩුවේ ක්‍රමෝපායන්ට සිය සහයෝගය පල කරමින් දක්ෂිනාංශික ඉරිදා දිවයින පුවත්පත ජුලි 11 දින "සමිට්පුර කුඩ්ඩන්ගේ 'මට්ටක්කුලිය' මෙහෙයුම" යන හිසින් යුත් ලිපියක් පලකලේ ය. එහි මෙසේ සඳහන් වෙයි. "මට්ටක්කුලිය පොලීසියට ප්‍රහාර එල්ල කල මත්කුඩු ජාවාරම්කරුවන් සහ පාතාල අපරාධකරුවන් පිරිසක් එහි නිලධාරීන් පලවා හැර පොලීසිය අත්පත් කර ගැනීමේ ආන්දෝලනාත්මක සිදුවීමෙන් මුලු පොලිස් දෙපාර්තමේන්තුවම දෙදරුම් කෑවේය."

හුදෙක්ම පොලිස් මර්දනය වහාම නතර කරන ලෙසට බල කිරීම පොලිස් ස්ථානයෙන් පිටත සිය ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ප්‍රකාශයට පත් කල මෙම පීඩිත ජනතාව මාධ්‍ය හා ආන්ඩුව විසින් "මැරවරයින්, කුඩු ජාවාරම්කරුවන්", හා "පාතාලේ ආධාරකරුවන්" ලෙස හංවඩු ගසා තිබේ. එසේම යුද්ධය පැවති අවධියේ දී ද ආන්ඩුව ජීවන තත්වයන් කාබාසිනියා කිරීමට එරෙහිව සටන් වැදුනු වැඩවර්ජිත කම්කරුවන් හෝ වෙනත් ඕනෑම කන්ඩායමක් බිය ගැන්වීම සඳහා ඔවුන් "ත්‍රස්තවාදීන්" නොවේ නම් "ත්‍රස්තවාදයට උදව් කරන්නන්" ලෙස හංවඩු ගැසීමේ උත්සාහයක ආන්ඩුව යලියලිත් නිරත වී තිබේ. කොලඹ පැල්පත්වාසී විරෝධතාකරුවන්ට එරෙහිව ද දැන් එවැනිම හංවඩුවක් ගසනු ලබයි.

බලගතු ආර්ථික අවශ්‍යතා මගින් මෙම ප්‍රවනතා දුවවනු ලබයි. ලක්ෂ පහකට අධික කොලඹ පැල්පත් වාසීන් ඉවත් කොට ඔවුන්ගේ ඉඩම් ආයෝජකයින්ට හා දේපල සමාගම් වෙත පැවරීමෙහි ආන්ඩුවේ සැලැස්ම ඉලක්ක කොට ඇති එක් ප්‍රදේශයක් මට්ටක්කුලියයි. රාජපක්ෂ විසින් නාගරික සංවර්ධන අධිකාරිය එල්ටීටීඊයට එරෙහි ලේ වැකි යුද්ධයේ අවසන් සිව් වසර තුල යුද්ධය මෙහෙයවූ ප්‍රමුඛ පුද්ගලයන්ගෙන් කෙනෙක් වන තම සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ මෙහෙය වීම යටතට පත් කිරීම කැපී පෙනෙන කාරනයකි.

මට්ටක්කුලිය ප්‍රහාරය පිලිබඳව සියලු විරුද්ධ පක්ෂ දක්වන නිහඬකම ද ඉහලින්ම කැපී පෙනෙයි. දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය හෝ සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන හෝ එයට විරුද්ධ වී නැත. ආන්ඩුව කම්කරු පන්තියට එරෙහිව ප්‍රහාරය උග්‍ර කරන විට ද ඔවුන් ඒ ආස්ථානය ම ගනු ඇත. මෙම පක්ෂවලට උතුරු නැගෙනහිර යුද්ධයට ඔවුන් සහය දුන් පරිදි ම ආන්ඩුවේ වෙලඳපල ගැති ආර්ථික වැඩපිලිවෙල හෝ එහි පොලිස් රාජ්‍ය ක්‍රමෝපායන් සමග මූලික මතභේදයක් ඇත්තේ නැත.

නව සමසමාජ පක්ෂයේ හා එක්සත් සමාජවාදී පක්ෂයේ හිටපු රැඩිකලුන් ද එපරිද්දෙන් ම මට්ටක්කුලිය පොලිස් මිලිටරි ප්‍රචන්ඩත්වයට හා මූලික නෛතික හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කරන ආන්ඩුවේ ප්‍රහාරයන් පිලිබඳව මුනිවත රකී. ඒ වෙනුවට වැටුප් රැකියා හා ජීවන තත්වයන්ට එල්ල කෙරෙන අය-වැය ප්‍රහාරයන්ට එරෙහි කම්කරු පන්තියේ ප්‍රතිරෝධය පීලි පන්නා අවමන්ගත කිරීම සඳහා ඔවුහු වෘත්තීය සමිති සමග යුහුසුලුව වැඩෙහි යෙදී සිටිති.

වසරකටත් පෙරාතුව යුද්ධය අවසන් වී ඇතත් රාජපක්ෂ ආන්ඩුව මිලිටරි යාන්ත්‍රනය ශක්තිමත් කරමින් සිටී. තවමත් ආරක්ෂක වියදම අයවැයෙන් සියයට 15 කට වග කියයි. ඒ සමගම ආරක්ෂක හමුදාවන්ට පුලුල් බලතල පැවරෙන හදිසි නීති රෙගුලාසි සියල්ලම පාහේ එලෙසම පවතී. අසීමිත වාරගනනක් ජනාධිපතිවරනයට ඉදිරිපත් වීමට ඉඩ සලසමින් ව්‍යවස්ථාවේ වෙනස්කම් යෝජනා කරමින් ද ප්‍රමුඛ රාජ්‍ය නිලධාරීන් පත් කිරීමේ බලතල තමන් අත තබා ගනිමින් ද රාජපක්ෂ, විවෘතව ම තල්ලු වෙමින් සිටින්නේ තව තවත් ආඥාදායක ස්වරූපයේ පාලනයක් කරා ය.

රට තුල හිස ඔසවන පොලිස් රාජ්‍ය පාලනය ජාත්‍යන්තරව සිදුවෙමින් තිබෙන ක්‍රියාවලියක වඩාත් ඉහල ප්‍රකාශනය අත් කර ගනී. මහා බැංකු සහ සමාගම්වල අනසක යටතේ ක්‍රියාත්මක වන සෑම රටකම ආන්ඩු ගෝලීය ආර්ථික අර්බුදයේ බර වැඩ කරන ජනතාව මත පැටවීමේ අරමුන ඇතිව වඩ වඩාත් රාජ්‍ය මර්දනය වෙත නැඹුරු වෙමින් සිටී.

පසුගිය මාසයේ ටොරොන්ටෝහි පැවති ජී-20 සමුලුව අවස්ථාවේ මෙම මාරුව සංකේතවත් කරමින් කැනේඩියානු ආන්ඩුව විරෝධතාවේ නියැලුනු තරුනයන්, වෘත්තීය සමිති සමාජිකයන්, සමාජ හා පරිසරවේදීන් මත කඩා වැදීමට දහස් ගනනක පොලිස් බල ඇනි මෙහෙයවන ලදී. 2008-2009 වසරවල මූල්‍ය පද්ධතිය නගාසිටවූ ඇපදීම් හා උත්තේජක පියවරයන් නිසා හටගත් දැවැන්ත රාජ්‍ය නය ගෙවා දැමීමට කප්පාදු පියවර යොදාගැනීම සම්බන්ධීකරනය සඳහා සමුලුව කැඳවා තිබුනි.

වැඩ කරන ජනතාව තමන් වටා පෙල ගැසෙමින් තිබෙන අන්තරාය හඳුනාගත යුතුය. මට්ටක්කුලියේ සිදුවූවාක් වැනි අනාරක්ෂිත ජනතාව වෙත එල්ල කල එවන් ප්‍රහාරයක් දශක කිහිපයකට පෙර නම් ඔවුන් ඉවසා සිටුනු නැත. පෙර දී ප්‍රජාතන්ත්‍ර

අයිතීන් සුරකින බව කියා පෑ සියලු පැරනි පක්ෂ හා සංවිධාන අද දිනයේ ආන්ඩුව සමග පෙලගැසී සිටී.

සමස්ථ කම්කරු පන්තියේම මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමේ කොටසක් ලෙස පැල්පත් වාසීන්ට එල්ල කල ප්‍රහාරයන්ට විරුද්ධත්වය පල කිරීම සඳහා කම්කරුවන් හා තරුනයන් වෘත්තීය සමිති හා හිටපු රැඩිකලුන්ගේ නිර්ලජ්ජිත බියකුලුකම හා එකට පෙලගැසීමට එරෙහිව තමන්ම පෙරමුනට ආ යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) කම්කරුවන්ගෙන් ඉල්ලා සිටින්නේ මට්ටක්කුලියේ දී අත්අඩංගුවට ගත් සියලු දෙනා නිදහස් කරන ලෙස ද ප්‍රදේශය පුරා නිවාස හා බඩුබාහිරාදියට සිදුකල අලාභහානි වෙනුවෙන් වන්දි ගෙවන ලෙස ද බල කරන ලෙසයි. සේවා ස්ථානයන්හි සිට යෝජනා සම්මත කර ඉදිරිපත් කල යුතු අතර මෙම ප්‍රහාරයේ දේශපාලන අර්ථභාරය හා ඇඟවුම් සාකච්ඡා කිරීමට රැස්වීම් ගොඩ නැගිය යුතු ය.

උතුරේ හා නැගෙනහිර යුද්ධය ජයගත් රාජපක්ෂ ආන්ඩුව ඉමහත් ලෙස ශක්තිමත් කල මිලිටරි හැකියාවන් ද සහිතව දකුනේ වැඩකරන ජනතාව හා දුගීන් වෙත කඩාපනිනු ඇති බවට *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හා සසප අඛන්ඩව අනතුරු අඟවා තිබේ. යුද්ධයට එරෙහි වෙමින් උතුරෙන් හා නැගෙනහිරින් හමුදාව ඉවත් කල යුතු බව එක දිගට කියාසිටි පක්ෂය සසප ය.

ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන කොන්දේසි රැකගැනීමේ අරගලය ආන්ඩුවට සහ එහි වෘත්තීය සමිති හා හිටපු රැඩිකලුන්ට එරෙහි දේශපාලන අරගලයක් ඉල්ලා සිටී. ධනවතුන් අතලොස්සක් වෙනුවෙන් නොව අතිමහත් බහුතරයකගේ යහ පැවැත්ම වෙනුවෙන් ආර්ථික ප්‍රතිසංවිධානය කිරීම සඳහා කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් බලයට පත් කල යුතු ය. ශ්‍රී ලංකාවේ ද දකුනු ආසියාවේ ද ලෝකය පුරා ද සමාජවාදී ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයක් සඳහා සටන් කරන, වාර්ගික රේඛා ඉක්මවා සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරු පන්තිය එක්සත් කරන ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම මෙයින් ඉල්ලා සිටිනු ලබයි.

© www.wsws.org